# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුමිය!
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 15
NUMBER 04

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

JULY 2012 ජූලි මාසය (බුද්ධ වර්ෂ 2556 ඇසළ මාසය)

http://www.lankaviththi.org



# ඉන්දියාවේ 'ලොකු අයියා' පාට් එක!

## මෙනන් ආවේ එය අපට දන්වන්නටය

♦ සංජය විමලරත්න විසිනි

**දැ**නට දින දහයකට පමණ පෙර ඉන්දියාවේ ජාතික ආරක්‍ෂක උපදේශක ලෙස කටයුතුකරන ශිව ශංකර් මෙනන් හදිසියේම ලංකාවට දුවගෙන ආවේ ය. කලකට පෙර ඔහු ශ්‍රීලංකාවේ ඉන්දියානු මහකොම සාරිස් ලෙස කටයුතු කළ බව ඔබට මතක ඇත. දැන් ඔහු භාරතයේ ජාතික ආරක්‍ෂා උපදේශක ලෙස කැබිනට් තත්වයෙන් කටයුතු කරන්නෙකි.

මෙනන් පසුදාම උදේ ආහාරය ගන්නා වේලේ ශ්‍රීලංකා ජනාධිපතිවරයා සමග ආරක්‍ෂක ඇමති ගෝඨාභය රාජපක්‍ෂ ද හමු වීය. එදාම උතුරු නැගණහිර සංවර්ධන කටයුතු භාරව සිටින බැසිල් රාජපක්‍ෂ ඇමතිවරයා ද මුණගැසුණේය. එයට පසුව විගස දෙමළ එක්සත් සන්ධානයේ මන්ත්‍රී ආර්. සම්බන්ධන් ද හමුවීය.



Shiv Shankar Menon
Indian Security Advisor

ඔහු සඳහන් කළ මුල් කරුණු දැනට මාස කීපයකට පෙර ලංකාවට පැමිණි ඉන්දියානු පාර්ලිමේන්තුවේ සියළු පක්‍ෂ නියෝජිත පිරිසක් උතුරු නැගණහිර සංචාරයකින් පසු එහි කටයුතු කෙරෙන ආකාරය පිළිබඳව ඔවුන් ඉන්දියාවට ඉදිරිපත් කර ඇති වාර්තාවය. මෙනන් ඊළහට ගෙන ආවේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම ශ්‍රීලංකාව ගැන ලබන නොවැම්බරයේ කරන විමර්ශනය ගැන සඳහනකි.

සෑම වසර හතරකට වරක් ලොව සියළු රටවල් වල මානව හිමිකම් තත්වයන් ගැන සොයා බැලීමක් සිදුවේ. එහිදී කොමිසමට ඒ ඒ රටේ වාර්තා වක් ඉදිරිපත් කළ යුතුය. ඒ වාර්තාව තවත් රටවල් තුනක් අනුමත කළ යුතුය. මේ නොවැම්බරයේ ලංකාව ගැන ඉදිරිපත්කරන වාර්තාවට ස්පාකද්කදය ඉන්දියාව සහ අප්‍රිකානු රටක් වන බෙනින් අනුමත අත්සන තැබිය යුතුය. එම මානව අයිතිවාසිකම් වාර්තාව පිළිබඳව ඇමති මහින්ද සමරසිංහ දැනට කටයුතුකරන බව ජනාධිපතිවරයා මෙනන්ට දන්වා ඇත.

### මෙනන් පැවසූ දේ

ජනාධිපතිවරයා සමග සාකච්ඡාවේදී Reconciliation හෙවත් සංහිඳියා ක්‍රියාවලිය ගැන කතාබහ කෙරෙද්දී එම කටයුත්ත ප්‍රධාන වශයෙන් ශ්‍රීලංකා රජය සතු බවත්, ඒ ගැන දිල්ලිය ගරු කරන බවත් මෙනන් පැවසීය. එසේම දේශපාලන විසඳුමක් සඳහා ලංකා රජය පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් Parliament Select Committee පත්කර තිබීම ගැන ද දිල්ලිය සතුටු වන බව ද කියා ඇත.

එසේ වී නමුත් දැනට ද්‍රවිඩ සංධානය (TNA) ශ්‍රීලංකා රජය ඔවුන් සමග ද්විපාක්‍ෂික සාකච්ඡාවක් පවත්වන්නට කැමැත්ත දෙන තෙක් සංහිඳියා යෝජනාවල් වලට ඔවුන් එකඟනොවන්නට තීරණයකර ඇති නිසා එය මගහරවන්නට කළ යුතු දේවල් මෙනන් ලංකා ජනාධිපතිවරයාට යෝජනා කර ඇත.

එනම් උතුරේ පළාත් සභා ඡන්දය ඉක්මනින් පැවැත්විය යුතුය. එය පවත්වනන්නට ශ්‍රීලංකා රජය සූදානම් බව ප්‍රකාශවන නියත දිනයක් දැන්මම තීරණය කළ යුතුය. රජය එසේ කළ විට එය රජය ද්‍රවිඩ ප්‍රශ්න විසඳන්නට අවංකවම කටයුතුකරන බව ජාත්‍යන්තර ප්‍රජාවට පැහැදිලිවන ඉඟියක් වනු ඇතැයි ද මෙනන් ශ්‍රීලංකා ජනාධිපතිවරයාට පවසා ඇත.

### ජනාධිපතිගේ පිළිතුරු

ශ්‍රීලංකා රජයේ පැත්තෙන් දන්වා සිටින්නේ උතුරේ පළාත් පාලන ඡන්දයක් පවත්වන්නට අවශ්‍ය පියවරවල් රජය ගෙන ඇති බවත් එහෙත් ඒවා ක්‍රමානුකූලව සිදුකිරීමට නම් ඊට පෙර උතුරේ වළලා ඇති බිම්බෝම්බ ඉවත් කළ යුතු බව ජනාධිපතිවරයා මෙනන්ට පැහැදිලි කළ බවත්ය. එසේම 2012 වසර අවසන් වන්නට පෙර එය පවත්වන්නට රජය අදහස් කරන බව ද පවසා ඇත.

එහෙත් ඉදිරියේදී තවත් පළාත්පාලන ඡන්ද තුනක් රටේ පවත් වන්නට යෙදී ඇති බැවින් රජය මෙනන්ට එවැනි පොරොන්දුවක් වූයේ ඇයි දැයි අපට නොතේරේ.

මෙනන් මෙහිදී පැහැදිලිවම කියා ඇති කරුණ මෙයයි.


එනම් ලංකාවේ මානව හිමිකම් වාර්තාව නොවැම්බර් මස ඉදිරිපත්කිරීමේදී ඉන්දියාව ඒ කෙරෙහි ගන්නා පියවර තිරණය වන්නේ ලංකා රජය උතුර සම්බන්ධව ගන්නා පියවර අනුව බවය.

මෙයින් පෙන්වන්නේ කුමක්ද? දැන් ඉන්දියාව එම කලාපයේ **ලොකු අයියාගේ** චරිතය රඟපාමින් ජාත්‍යන්තර කතාවක් ඉදිරියට ගනිමින් එසේම ඇමරිකාවේ අතවැසියෙකු ලෙස එයට කඩේ යමින් ලංකාවට තරවටුකරන උඩඟු විලාශයෙන් හැසිරෙන බවක් නොවේද?

මෙහිදී පෙනෙන තවත් දෙයක් නම් ඉන්දියාව අපේ අත අඹරවා දෙමළ සන්ධානයට (TNA) උතුරේ බලයට එන්නට හැකිවන අයුරින් උතුරේ පළාත් සභා ඡන්ද රජය ලවා වහා පවත්වා ගැනීමටය.

4 වන පිටුවට →

## ❊ ❊ Father's Day පිය දිනය ❊ ❊



සි ය වර පැකිළ පය ඔසවන වෙලා වෙදී
නොය මින ළඟින් හිඳ අත පෑ හැඩුම් නොදී
දි ය ණියකගේ සඳ ඔබ අම්බරේ රැඳී
පි ය සෙනෙහසට කවි ගී ලියවුණා මදී

**When toddler me tripped hundreds of times**
**You stayed near and grabbed me, sparing my sobs**
**You are the daughter's moon lighting up the sky**
**Not enough poetry on fatherly love, I wonder why ?**

♦ දයා ආනන්ද රණසිංහ ♦ *Daya Ananda Ranasinghe*

## ලන්ඩන් ඔලිම්පික්
## ජූලි 27 - අගෝ: 12






අප සැමගේ විශ්වාසය දිනූ

FAST CASH
SEND TODAY - COLLECT TODAY

විස්තර පිටු අංක 3